

# අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් එකිනෙකාට උපකාර කර ගනිති

ලුහුඬින්

ICRC




“මගේ පුතා අතුරුදහන්වී අවුරුදු 26 ක් ගතවෙලා. මේ කණ්ඩායමට එකතුවන තුරු අපි අපේ පවුලෙන් පිටස්තර කිසිවෙකු සමඟ ඒ සම්බන්ධයෙන් කතා කළේ නැහැ. කලින්, අපි එකම ගමේ දිවිගෙවූවත් අප නිතරම මුණගැසුණත්, අපට ඇති වේදනාව ගැන අප කතා කළේ නැහැ. අපි යන එන ගමන් මුණගැසුනු විට සුහදත්වය පළ කළා. දැන් අපි එකිනෙකා හොඳින් දැන හඳුනාගෙන සිටිනව. අපේ අතුරුදහන් වූ දරුවන් ගැන කතාකිරීමෙන් අපි අවුරුදු ගණනාවක් මුළුල්ලේ දරාගෙන සිටින මහා බරකින් යම් සහනයක් අපට අත්වී තියෙනවා.”

- අතුරුදහන් වූ පුතෙකුගේ මව




# සහායක වැඩසටහන

ශ්‍රී ලංකාවේ පැවති සන්නද්ධ ගැටුමේ ප්‍රතිවිපාකයක් ලෙස, අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයන් ඇතුළු අනෙකුත් තැනැත්තන්ගේ පවුල්වල බහුවිධ අවශ්‍යතා අවබෝධ කරගැනීම පිණිස, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් 2014 ඔක්තෝබර් සිට 2015 නොවැම්බර් දක්වා දිපව්‍යාප්ත තක්සේරුවක් සිදුකරන ලදී. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මෙම තක්සේරුවේදී අතුරුදහන්වූවන්ගේ පවුල්වල හඳුනාගත් අවශ්‍යතා සහ එම අවශ්‍යතා ආමන්ත්‍රණය කළ හැකි ආකාරයන් පිළිබඳව නිර්දේශයන් 2016 ජනවාරි මාසයේදී අදාළ බලධාරීන් වෙත ලබා දී ඇත.

මෙම තක්සේරුවේ මහජන වාර්තාවක් 2016 ජුලි මාසයේදී ප්‍රකාශයට පත්කරන ලදී. එම වාර්තාව ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් https://www.icrc.org/en/document/sri-lanka-families-missing-persons වෙබ් අඩවියේ පළ කර ඇත.

එම තක්සේරුවට අනුව, අදාළ පවුල්වලට වඩාත්ම අවශ්‍යව ඇත්තේ තම ප්‍රියාදරයන්ට සිදුවූයේ කුමක්දැයි දැනගැනීමටයි. ඔවුන්ට තම ප්‍රියාදරයන් තමන් ළඟ නොමැති නිසා හටගත් අවිනිශ්චිතභාවය සමගින් කටයුතු කරගෙනයාම පිණිස චෛතසික පිහිටාධාර, යථාතත්වයට පත්වීමට සහ ජීවනෝපාය කටයුතු සංවර්ධනය පිණිස ආර්ථික ආධාර, නෛතික හා පරිපාලන කටයුතු වෙනුවෙන් උපකාරද අවශ්‍යව ඇත. මෙම අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස 2015 අගභාගයේදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව දිපව්‍යාප්තව සහයෝගිතා සත්කාරය යන සහායක වැඩසටහන ආරම්භ කළේය. එය සෘජුවම මෙන්ම එම ප්‍රදේශවල පිහිටි සංවිධානයන් මාර්ගයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහනින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට ඔවුන් මුහුණදී සිටින භාවමය අභියෝගවලදී මෙන්ම ආර්ථික, නෛතික සහ පරිපාලන ගැටලු විසඳාගැනීම පිණිස උපකාර කරයි.

1. මානසික සෞඛ්‍ය සහ මනෝසමාජීය උපකාර: තම ප්‍රියාදරයන් අතුරුදහන්වීම නිසා ඔවුන් පිළිබඳව තොරතුරු නොමැතිව ‘අවිනිශ්චිත අහිමිවීම’ යනුවෙන්ද හැඳින්වෙන තත්වය සමඟ දිවිගෙවන එම අවිනිශ්චිතභාවය නිසා විවිධ දුෂ්කරතා මධ්‍යයේ කටයුතු කරගෙන යන අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට භාවමය සහයෝගය සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල අවශ්‍යතා සහ දුෂ්කරතා පිළිබඳව බලධාරීන් සහ මානසික සෞඛ්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීම;

2. යොමුකිරීමේ සේවා: මෙම වැඩසටහනේ විෂය පථයෙන් පරිබාහිර තම නෛතික, පරිපාලන සහ

ආර්ථික ගැටලු විසඳාගැනීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් අදාළ සේවා සලසන ආයතන වෙත යොමුකිරීමෙන් හා මගපෙන්වීමෙන් ඔවුන්ට උපකාර කිරීම.

3. ආර්ථික සුරක්ෂිතතාව: ප්‍රයෝජනයට ගැනීමට වෙනත් සම්පත් නොමැති විට අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් අතුරින් වඩාත් පීඩාවට පත්වීමේ අවදානමෙහි පසුවන පවුල්වලට තම ජීවනෝපායන් යළි ආරම්භ කිරීමට හෝ පුළුල් කරගැනීමට ආධාර කිරීම.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ තැනැත්තන් වෙනුවෙන් ඉටුකරන මානුෂවාදී සේවාවන්හි එක් කොටසක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් සෙවීමේ ජාතික යාන්ත්‍රණයකටද (අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය) තාක්ෂණ ආධාර සපයා ඇත.

## 1. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට මානසික සෞඛ්‍ය සහ මනෝසමාජීය උපකාර:

සහායක වැඩසටහනෙහි අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට මානසික සෞඛ්‍ය සහ මනෝසමාජීය උපකාර කිරීමේ කොටස ක්‍රියාත්මක කරනු ලබන්නේ "සහායකයන්" ලෙස හඳුන්වනු ලබන අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් තුළින්ම හෝ බාහිරින් බඳවා ගන්නා සමාජ සේවකයන් විසිනි. ඔවුහු තමන්ගේ ප්‍රජාවෙහි සෙසු අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සමඟ සෘජුව වැඩකරති. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව යම් නිශ්චිත ප්‍රදේශයක ජීවත්වන පවුල්වල මනෝසමාජීය අවශ්‍යතා අවබෝධය පිණිස ඔවුන් පුහුණු කර නිවෙස් වෙත යෑම ද සමප්‍රදස්ථක සහායක කණ්ඩායම් සැසි පැවැත්වීම මගින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට භාවමය සහයෝගය ලබාදීමද සිදුකරයි. මෙම සැසි මගින් එම පවුල්වලට අතුරුදහන් වූ තැනැත්තා පිළිබඳ මතකයන් සිහිපත් කිරීමට කවි, චිත්‍ර, අත්කම්, ගීත හෝ අතුරුදහන් වූ තැනැත්තා වඩාත් ප්‍රියකළ ආහාර හුවමාරු කරගැනීමට අවස්ථාව සැලසෙයි. තමන්ගේ ප්‍රියාදරයන් නොසිටීමේ ප්‍රතිඵල ලෙස මෙම පවුල්වල පැනනැගී ඇති පරිපාලනමය සහ ආර්ථික ගැටලු විසඳාගැනීම පිණිස ඔවුන්ට අදාළ සේවා කෙරෙහි යොමුවීමට සහායකයෝ මගපෙන්වති.

ගැටුම නිසා පීඩාවටපත් ජනතාවට මනෝසමාජීය ආධාර සැපයීමෙන් ලබා ඇති පළපුරුද්ද පාදක කරගෙන, සහායකයන් සමඟ වැඩකිරීමට තෝරා ගනු ලබන එම ප්‍රදේශවල ක්‍රියාත්මක සංවිධාන සමඟ සම්බන්ධ වී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ක්‍රියාකරයි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ අරමුණුවන්නේ දිගුකාලීනව මෙම වැඩසටහනේ තිරසර පැවැත්ම ප්‍රවර්ධනය කරමින් මෙම පවුල් පත්ව සිටින තත්වය අවබෝධ කරගැනීමට අවශ්‍ය තාක්ෂණ ප්‍රවීණත්වය සහ පසුබිම් දැනුම මෙම සංවිධාන වෙත ලබාදීමයි.




"කණ්ඩායම් සැසිවලදී ශෝකය සහ සන්තාපය බෙදා ගන්නා අපි සැහැල්ලු හදවතකින් යුතුව නිවෙස් කරා පියමන් කරමු"

- අතුරුදහන් වූ තැනැත්තෙකුගේ බිරිඳ


ICRC

## 2. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට යොමුකිරීමේ සේවා සැපයීම

සහායක වැඩසටහනින් සෘජුව ආමන්ත්‍රණය කළනොහැකි අවශ්‍යතා අදාළ සේවා සලසන බලධාරීන් වෙත යොමු කරනු ලැබේ. ඒවා පරිපාලන අවශ්‍යතා විය හැකි අතර එසේ නොමැති නම් මනෝචිකිත්සක සහාය වැනි වඩාත් සංකීර්ණ ස්වභාවයේ වෙනත් ගැටලු විය හැකිය.

පවුල්වල අවශ්‍යතා තක්සේරු කිරීමට සහ සේවා සපයන ආයතන සමඟ අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සම්බන්ධ කිරීමට ප්‍රදේශයේ ඇති සම්පත් ස්ථාන හඳුනාගැනීමට සහායකයන් පුහුණු කරනු ලැබේ. කල් නොයවා එම ඉල්ලීම් පිළිබඳව පසුවිපරම් කිරීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වගබලා ගනියි.


K.Prasanna/ICRC

වයස් ගතවෙලා නිසා හැමදාම වැඩකරන්න අමාරුයි. අපේ පුතා අතුරුදහන් වෙලා. ඔහු අප සමඟ කල්ගෙවු අවදියේ අපට තිබුණ සතුට දැන් නැහැ. ඔහු තවමත් අප සමග සිටියා නම් අපට මහත් පහසුවක් වෙනව. අපේ අමාරුකම් ගැන මම අපේ සහායකට කීවා. ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ලබාගන්න සමාජසේවා දෙපාර්තමේන්තුවට ඉල්ලුම්පතක් බාරදීමට මට උදව් කළා. දැන් මට මාසයකට රුපියල් 2000 බැගින් ලැබෙනව. මම ඒ මුදල් වැයකරන්නේ බෙහෙතුයි ආහාරයි මිලදී ගන්න. මට ලොකු සහනයක් දැනෙනවා.”

- අතුරුදහන් වූ තැනැත්තෙකු ගේ මවක්

# 3. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල ආර්ථික සුරක්ෂිතතාව වර්ධනය කිරීම

අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් තිරසර ආදායමක් අඩුවීමෙන් හෝ නොමැතිවීමෙන්, වත්කම්වලට හානිසිදුවීම හෝ ප්‍රමාණවත් නොවීම සහ අර්ථවත් ආධාර ලබාදීමක් නොමැතිවීම ඇතුළු ආර්ථික ගැටලු ගණනාවකට නිතරම මුහුණදෙති. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ පවුල්වලට ඔවුන්ගේ වත්කම් විකිණීමට, පරිභෝජනය කරන ආහාර ප්‍රමාණය අඩුකිරීමට හෝ තම හදිසි අවශ්‍යතා සපුරා ගැනීම පිණිස ණයට මුදල් ලබාගැනීමට සිදුවනු ඇත. තිරසර ලෙස මෙම අභියෝග ආමන්ත්‍රණය කිරීම පිණිස ඔවුන්ට උදව් කරමින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට ගැලපෙන පරිදි සකස් කරගත් ජීවනෝපාය ආධාර සපයයි.

ගෘහස්ථ ආර්ථික තක්සේරු සහ ව්‍යාපාර සඳහා වන යෝජනා සමාලෝචනය කිරීමෙන් පසුව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට ක්ෂුද්‍ර ආර්ථික ප්‍රාරම්භණ වැඩසටහන මගින් ආධාර සපයයි. සුදුසුකම් ලබන පවුල්වලට ඔවුන්ගේ යෝජනාවල විස්තර දැක්වූ කුඩා ව්‍යාපාරයක ආයෝජනය පිණිස මුදල් ප්‍රදානයක් ලැබෙයි. විශේෂයෙන් අසරණ තත්වයට පත්ව සිටින පවුල්වලට තම ආදායම ඉහළ නංවාගැනීමට සහ යහපත් ආහාර වේලක් ලබාගැනීමට, සුළු ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීමට උපකාර කරමින් ඔවුන්ගේ කඩිනම් අවශ්‍යතා සපුරාගැනීම සඳහා කොන්දේසි රහිතව මුදල් ප්‍රදාන ලබාදෙයි.

රජයේ තාක්ෂණ දෙපාර්තමේන්තු සහ වෙනත් සේවා සපයන ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට මූලික ව්‍යාපාර කළමනාකරණ කුසලතා පුහුණු කිරීම් මාර්ගයෙන් ඔවුන්ගේ ව්‍යාපාර දියුණුකර ගැනීමට උපකාර කරයි. තම ව්‍යාපාර පුළුල් කරගැනීමට සහ මූල්‍ය සේවා සැපයුම් ආයතන සහ ප්‍රජාව සමඟ මනා ලෙස ඒකාබද්ධවීමක් සඳහා මග සැලසීමට හැකිවන ජාලගතවීම මගින් ප්‍රජා සමුපකාර කරා ප්‍රවේශවීමට ඔවුන් පුහුණු කරනු ලැබේ. ඊට අමතරව ප්‍රතිචක්‍රිකරණය, කසළ කළමනාකරණය සහ කාබනික වගාව සම්බන්ධයෙන් මෙම පවුල්වලට තාක්ෂණික දැනුම ලබාදෙන නිසා ඔවුන්ගේ ක්ෂුද්‍ර ආර්ථික වැඩසටහන් තිරසර පරිසර සංරක්ෂණයටද දායක වෙයි.




M.Kamil/ICRC

"මගේ දියණිය ලස්සන ගැහැණු දරුවෙකු ලෙස හැදෙනු වැඩෙනු දකිමින් මම හැමදාම වෙහෙස මහන්සි වී වැඩකරනව. මම උත්සාහ කරන්නේ ඇයට ඉතා හොඳින් අධ්‍යාපනය ලබාදීමටයි. මගේ සතුටේ උල්පත එයයි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ජීවනෝපාය ආධාර වැඩසටහන නිසා මට කල්පවතින ආදායමක් උපයාගන්න හැකිවී තිබෙනව. මට අවශ්‍ය වන්නේ මට ඇගේ වයසේදී ලබාගැනීමට නොහැකිවුන හැම දෙයක්ම මගේ දුවට ලබාදෙන්නයි. එය සපුරා ගන්න ලැබෙන්නේ රාත්‍රිය පුරා බැග් සහ ඇඳුම් මැසීමෙන් නම් එය කිරීමටත් මම සූදානම්."

- අතුරුදහන් වූ තැනැත්තෙකු ගේ බිරිඳ




“තමන්ගේ ස්වාමිපුරුෂයන්ද අතුරුදහන්ව ඇති මගේ කණ්ඩායමේ අනික් කාන්තාවන් සමඟ කතාබහ කිරීමෙන් පස්සෙ මට සැහැල්ලුවක් සහ සතුටක් දැනෙනව. මම මා ලබා ඇති අත්දැකීම් මුල්කර ගෙන මා වැනි සෙසු කාන්තාවන්ට උපදෙස් දෙමින් සිටින්නියක්. දැන් අපේ කණ්ඩායමේ සාමාජිකාවන් අතර සමීප බැඳීමක් තියෙනවා. අපගේ සතිපතා රැස්වීම පැවැත්වීමට පෙරත් අපි දුරකථනයෙන් එකිනෙකා සමඟ කතා කරනවා.”

- අතුරුදහන් වූ තැනැත්තෙකු ගේ බිරිඳ

ලොවපුරා සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන් නිසා පීඩාවට පත් ජනතාවට ගරුත්වය රැකගැනීමට සහ ඔවුන්ගේ දුක්පීඩා සමනය කරගැනීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, රතු කුරුස සහ රතු අඩසඳ හවුල්කරුවන් සමඟ එක්ව නිතරම හැකි සෑම දෙයක්ම ඉටුකරමින් උපකාර කරයි. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කරමින් හා ශක්තිමත් කරමින් සහ විශ්වීය මානුෂවාදී ප්‍රතිපත්ති ප්‍රචාරණය කරමින් මෙම සංවිධානය පීඩාවන් වැලැක්වීමට උත්සාහ කරයි.

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 250 33 46
ෆැක්ස්: +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ්: www.icrc.org

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්, වව්නියාව
දුරකථන: +94 (0)24 222 28 55
ෆැක්ස්: +94 (0)24 222 25 37

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර,කොතුකුලම්,
පිල්ලයාරඩි මඩකලපුව
දුරකථන: +94 (0)65 222 70 70

ICRC

© ICRC, October 2021

1701/002 10.2021

පිටකවර ඡායාරූපය: ICRC